**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 2022**

**----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ අංක 38 දරන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු.216,860,050 ක් වූ දේපල පිරියත උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ප්‍රත්‍යාගණන කිරීම ආරම්භ කර ඇති දැව භාණ්ඩ, උපකරණ හා උපාධි ලෝගු 2023 වර්ෂයේ දී එම අගයන් ගිණුම්වලට ගැනීමට නියමිත අතර තිරරෙදි හා බුමුතුරුණු 2023 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ලබන බව.<br>වාහන රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2023.04.10 දින තක්සේරු කර ඇති අතර, තක්සේරු වාර්තා ලැබීමෙන් පසු ප්‍රත්‍යාගණන අගයන් ගැලපීමට අපේක්ෂිත බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල දී ලැබී තිබූ රු.1,025,338 ක පරිත්‍යාග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව හඳුනා ගැනීම හා මැනීම සිදුකර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ප්‍රමිත අංක 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කරනු ලබන බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මාර්තු 11 දින ජනාධිපති ලේකම් කාර්යාලයෙන් විශ්වවිද්‍යාලය වෙත පවරා දෙන ලද වටිනාකම රු.6,750,000ක් වූ වාහන දෙක ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | මෙම වාහන දෙකෙහි අයිතිය විශ්වවිද්‍යාලය වෙත 2022 වර්ෂය අවසානයේ පැවරී ඇති නමුත් මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතික විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇත්තේ 2023 පෙබරවාරි මාසයේදීය. 2023 අප්‍රේල් 10 රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කරන ලදී. වාහනවල ලියාපදිංචි අයිතිය විශ්වවිද්‍යාලයට පැවරෙන තෙක් තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කිරීම නොකරන ලද බව. | භාවිතයේ පවතින ස්ථාවර වත්කම් නියමිත පරිදි තක්සේරු කර ගිණුම්තැබිය යුතුය. |

### 1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල් | රු.642,020 | රු.285,480 | රු.356,540 | 2022 දෙසැම්බර් 29 දින එම ගිණුමට රු.356,540 ක චෙක්පතක් තැන්පත් කර ඇත. මෙම චෙක්පත නිශ්කාශනය වී ඇත්තේ 2023 ජනවාරි 03 වන අතර, ගිණුම්වල ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල් ඉතිරිකිරීමේ තැන්පතු මුදල ලෙස රු.642,020 ක් දැක්වීම නිවැරදි බව. | ඉතිරිකිරීමේ බැංකු පොත අනුව වර්ෂයේ අවසාන දිනට වූ ශේෂය මූල්‍ය ප්‍රකාශන ශේෂයට සමාන විය යුතුය. |
| (ආ) | දැව භාණ්ඩ ගිණුම්ගත කිරීම | රු.1,485,475 | රු.316,450 | රු.1,169,025 | මූල්‍ය ප්‍රකාශන අනුව දැව භාණ්ඩ ගිණුමේ වටිනාකම, දැව භාණ්ඩ ලෙජර් ගිණුම හා ස්ථාවර වත්කම් ලේඛනයේ වෙනසක් නොමැති බව. | පිළිතුර පිළිගත නොහැක. මූල්‍ය ප්‍රකාශනවල අගයන් සමඟ ලෙජරය හා අනෙකුත් අදාල ලේඛනවල අගයන් |

සමාන විය යුතුය.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල දී රු.31,387,500ක් ආයෝජනය කර තිබුණි. | 2023 වර්ෂයේ සිට චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව. | මුදල් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 15 වන වගන්තියේ (VI) ඡේදය | අමාත්‍යවරයා විසින් පත්කල යුතු පාලක සභාවේ සාමාජිකයින් අධ්‍යාපන, මූල්‍ය, නීති සහ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ඨ සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් වියයුතු වුවද පාලක සභාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ තැනැත්තකු නොසිටි අතර නීති ක්ෂේත්‍රයේ නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි. | 2021.01.01 දිනැතිව විශ්වවිද්‍යාලය විසින් මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බව. කෙසේ වුවද විගණන හා කළමනාකරණ කමිටුව සඳහා වරලත් ගණකාධිකාරීවරයෙකු, වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් තෝරා පත්කර ගෙන ඇති අතර මුදල් කමිටුවට සහ විගණන හා කළමනාකරණ කමිටුව යන කමිටු දෙකම සඳහා භාණ්ඩාගාර නියෝජිතයන් පත්කර ඇති බව. | 1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල (සංශෝධන) පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2019 ඔක්තෝබර් 7 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය (i)ඇමුණුම3 – A | තත්ත්ව ආරක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂ තනතුර, අනෙකුත් ප්‍රධාන පරිපාලන වගකීම් වලින් පරිබාහිර පූර්ණ කාලීන තනතුරක් විය යුතු වුවද බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති මහාචාර්යවරයෙකු එම තනතුර සඳහා පත් කර තිබුණි. | මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත තනතුර සංඛ්‍යාව 71 කි. එයින් පුරප්පාඩු 20 ක් පවතී. මෙම පුරප්පාඩු පිරවීම සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නැත. එවන් අවස්ථාවක තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානයේ පූර්ණ පත්වීමක් සිදුකළ නොහැකිය. පවත්නා ප්‍රායෝගික තත්ත්වය මත මේ අවස්ථාවේදී පූර්ණ වෙනත් වගකීම් වලින් පරිබාහිර ආචාර්යවරයකු පත් කිරීමට නොහැකි බව. | චක්‍රලේඛවලට අනුගතව කටයුතු කළ යුතුය. |
| (ii) ඇමුණුම 3 - B (2) | අධ්‍යක්ෂකවරයා විසින් තත්ත්ව ආරක්ෂණ ඒකකය සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ සකස් කිරීම හා ඒකකය සඳහා තුන් අවුරුදු උපායමාර්ගික සැලැස්මක් සකස් කර පාලක සභාව විසින් අනුමත කර ගැනීම කලයුතු වුවද ඒ සඳහා 2022 වර්ෂයේ දී කමිටුවක් | සනාතන සභා අනුමැතිය මත තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය සඳහා වසර 3 ක උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමට පත්කල අනුකමිටුව වාර කිහිපයක් රැස්වී එහි කෙටුම්පත සකස් කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පත් කිරීම පමණක් සිදු කර තිබුණි. | සඳහා සනාතන සභා අනුමැතිය සහිතව අනු කමිටුවක් පත් කර දැනට මෙම මාර්ගෝපදේශ සංග්‍රහය කෙටුම්පත් කර ඇති බව. | |
| (iii) ඇමුණුම 3 – C (4) | අධ්‍යක්ෂකවරයාගේ කටයුතු කිරීම උදෙසා ස්ථිර පදනම මත සහකාර ලේඛකාධිකාරීවරයෙක්, කළමනාකරණ සහකාරවරයෙක් සහ වැඩ සහායකවරයෙක් පත් කල යුතු වුවත් තාවකාලික පදනමින් අභ්‍යන්තර විභාග අංශයෙන් සහකාර ලේඛකාධිකාරීවරයෙක් සහ බෞද්ධ අධ්‍යයන පීඨයෙන් කලමනාකරණ සහකාරවරයෙක් පත් කර තිබුණි. | අංශ තුනක් සඳහා ප්‍රමාණවත් නිලධාරීන් නොමැති අවස්ථාවක අනුමත තනතුරු යටතේ වෙනත් ස්ථිර අයකු පත්කිරීමට නොහැකි විය. තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානයට ස්ථිර පදනමින් එම තනතුරු ඇතිකර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය හා කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාකර ඉදිරි කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,165,325 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.47,275,438 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.58,440,763 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර රු.44,895,000 කින් හා ආයෝජන ආදායම හා ණය පොලී ආදායම රු.9,440,559කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ රු. මිලියන 440.2 ක් වූ සමස්ථ ආදායම සමාලෝචිත වර්ෂයේදී රු. මිලයන 546.5 ක් දක්වා සියයට 24 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ඉපයූ ආදායම පිළීවෙලින් රු. මිලියන 23.2 ක් හා රු.මිලියන 84.5 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉපයූ ආදායම සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 61.3 කින් හෙවත් සියයට 264 කින් ඉහළ ගොස් තිබුණි.

ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ සමස්ථ වියදම පිළිවෙලින් රු. මිලියන 487.3 ක් හා රු. මිලියන 534.8 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 47.5 කින් ඉහළ ගොස් තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 0.6 : 1 ක් හා 0.54 : 1 වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාත පිළිවෙලින් 1.05 : 1 ක් හා 0.98 : 1 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 05 දෙනෙකු වෙත ලබා දී තිබුණු එකතුව රු.2,166,924 ක් වූ පර්යේෂණ දීමනාවලට අදාල පර්යේෂණ පත්‍රිකා 2023 මැයි 31 දින වන විට ද අවසන් කර නොතිබුණි. | පර්යේෂණ පත්‍රිකා අවසන් කර භාර දීමට සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩල සහ නිලධාරීන් දැනුවත් කරන ලද බව. | සියලු පර්යේෂණ සම්බන්ධයෙන් පර්යේෂණ කමිටු රැස්වීම් පවත්වා ප්‍රගතිය නිරීක්ෂණය කර නියමිත දිනට පර්යේෂණ පත්‍රිකා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා දේශීය හා විදේශීය අධ්‍යයන නිවාඩු ලැබූ කථිකාචාර්යවරුන් තිදෙනෙකුගේ බැඳුම්කර වටිනාකම් ගණනය කිරීමේදී වාර්ෂික වැටුප් වර්ධකවලට අනුව පර්යේෂණ දීමනාව හා අධ්‍යයන දීමනාව සැලකිල්ලට නොගැනීම නිසා රු.5,595,834 අඩුවෙන් බැඳුම්කරය ගණනය කර තිබුණි. | ඉදිරියේදී එවැනි දෝෂ වළක්වා ගනිමින් නිවැරදිව කටයුතු කරන බව. | බැඳුම්කර වටිනාකම් නිවැරදිව ගණනය කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඇස්තමේන්තුගත වටිනාකම රු.190,135,000 ක් වූ (වැට් රහිත) විදේශ සිසුන් 200 ක් සඳහා නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2021 අප්‍රේල් 11 දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද කොන්ත්‍රාත් කාලය අවස්ථා දෙකකදී දීර්ඝ කිරීමෙන් පසු නිමකල යුතු දිනය 2022 අගෝස්තු 30 දින වී තිබුණි. 2022 පෙබරවාරි 28 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.148,336,250 ක් ගෙවා තිබුණු අතර 2022 මැයි මාසයේ සිට ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි. කොන්ත්‍රාත්තුව අතහැර දැමීමෙන් රජයට සිදුවූ අලාභය කාර්යසාධන බැඳුම්කරය කල්ඉකුත් වීමට පෙර කොන්ත්‍රාත්කරුගෙන් අයකර | කොවිඩ් 19 වසංගත තත්ත්වය හා දේශපාලනික අර්බුදය හේතුවෙන් මාස 5 කට අධික කාලයක් වැඩ බිම වසා තැබීම නිසා වාර දෙකකදී ඉදිකිරීම් කාලය දීර්ඝ කර ගෙන ඇති බව.<br>ඉදිකිරීම් ආරම්භ කිරීමට අදාළ කොන්ත්‍රාත් ආයතනය පියවර ගෙන නොමැති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට 2023.03.21 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ නීති නිලධාරිනිය සමඟ රැස්වීමක් පවත්වා 2023.04.11 දින ලිපියක් කොන්ත්‍රාත් ආයතනය වෙත යොමු කරන ලද බව.<br>එසේම කාර්ය සාධන බැඳුම්කරය යාවත්කාලීන කරන ලෙස අදාළ කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කළද එයට ප්‍රතිචාරයක් නොතිබුණු බව. | කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු නිවැරදි කරගෙන නියමිත පරිදි කොන්ත්‍රාත් අවසන් කිරීමට හා රජයට අලාභයක් සිදු නොවන ආකාරයෙන් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | ඇස්තමේන්තු වටිනාකම රු.252,327,545 ක්වූ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කොළඹ පරිශ්‍රයේ පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2019 නොවැම්බර් 18 දින කොන්ත්‍රාත්කරු වෙත රු.14,508,834 ක අත්තිකාරමක් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. වසර 3 කට වැඩි කාලයක් පෞද්ගලික කොන්ත්‍රාක්කරුවකු අතරැදී මුදල් 2022 දෙසැම්බර් 31 දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති අත්තිකාරම් මුදලින් මේ වන තෙක් කර ඇති කාර්යයන් සඳහා බිල්පතක් ඉදිරිපත් කර ඇති අතර එම බිල්පත පරීක්ෂා කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව. | කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු නිවැරදි කර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාකාරී සැලැස්මට අනුව අධ්‍යයන පාඨමාලා සංවර්ධනය කිරීමේ අරමුණ යටතේ පාඨමාලාවල විෂයමාලා යාවත්කාලීන කිරීම සහ විවිධ වෘත්තිකයන් ඉලක්ක කරගත් කෙටිකාලීන පාඨමාලා හඳුන්වා දිය යුතු වුවද අදාල කාර්යයන් සිදු කර නොතිබුණි. ඩිප්ලෝමා හා කෙටි කාලීන පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂයේදී එක් එක් විෂයයන් සඳහා සිසුන් 100 කට වඩා අඩු සංඛ්‍යාවක් ලියාපදිංචි වී තිබුණි. | ලියාපදිංචි සංඛ්‍යාත්මක අගයට වඩා වැඩි ප්‍රමාණයක් ලියාපදිංචි වී ඇති බව. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්ක ලඟා කරගැනීමට කටයුතු කළ යුතුය. |